# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.08.20 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1615 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අයිස් මත්ද්‍රව්‍ය, ගිනි අවි හා පතරොම් සමඟ සැකකරුවන් 10 දෙනෙකු අත්අඩංගුවට - ගණේමුල්ල පොලිස් ස්ථානය.**

ගණේමුල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත 2025.08.19 වන දින උදෑසන කාලයේ කොස්හින්න, පරකන්දෙනිය ප්‍රදේශයේ නිවසක් පරීක්ෂා කිරීමේදී එම නිවසේ තිබී පහත සඳහන් මත්ද්‍රව්‍ය, ගිනි අවි හා උණ්ඩ සමඟ නිවසේ සිටි සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

- **රිපීටර් ගිනි අවි 01**
- **එම පතරොම් 08**
- **ටී 56 මැගසින් 09**
- **මි.මි. 09 පතොරම් 05**
- **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 22 මිලිග්‍රෑම් 900 යි.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20, 22, 23 සහ 28 වයස්වල පසුවන රාජගිරිය, බොරැල්ල, මාලඹේ, ඔබේසේකරපුර, කටුලන්දවත්ත සහ මොරටුගස්මුල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන්ගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීම් වලදී මීගමුව පොලිස් වසමේ දළුපත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර පහත සඳහන් ගිනි අවි හා දේපල සොයා ගෙන සැකකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. එම දේපල වන,

- **විදෙස් රටක නිෂ්පාදිත පිස්තෝල අවි 01 යි.**
- **එම පතොරම් 06 යි.**
- **යුද හමුදා ඇඳුමට සමාන නිල ඇඳුම් 01 යි.**
- **ජංගම දුරකථන 06 යි.**
- **ටී-56 පතොරම් 183 යි.**
- **9 mm පතොරම් 280 යි.**
- **මත්පෙති 300 යි.**
- **අත් විලංගු 01 යි.**
- **වෙනත් පුද්ගලයින්ගේ විදෙස් ගමන් බලපත්‍ර 03 යි.**
- **තරාදි 02 යි.**
- **සීලර් යන්ත්‍ර 01 යි.**
- **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 128 මිලිග්‍රෑම් 100 යි.**

**සැකකරුවන් අවුරුදු 20 සහ 30 වයස්වල පසුවන දළුපත, කටාන, කදිරාන සහ දිවුලපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකරුවන් සම්බන්ධව ගණේමුල්ල සහ මීගමුව පොලිස් ස්ථාන වැඩිදුර විමශර්න කටයුතු සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**